# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

# උපකුලපති ධුරය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 34 වන වගන්තිය හා එහි තදනන්තර සංශෝධන ද, අංක 02/2020 කොමිෂන් සභා චක්‍රලේඛයේ විධිවිධාන ද ප්‍රකාරව ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයෙහි පාලක සභාව විසින් එහි උපකුලපති ධුරය සඳහා අයදුම්පත්/ නාම යෝජනා කැඳවනු ලැබේ. අයදුම්කරුවන් / නාමිකයන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු අතර වයස අවුරුදු හැට තුනකට අඩු විය යුතු ය. පත්වීම ලද දින සිට වසර තුනක කාලයක් සඳහා හෝ පත්වීම්ලාභියාගේ වයස අවුරුදු හැට පහක් (65) සම්පූර්ණ වන තුරු හෝ යන දෙකෙන් පූර්වයෙන් එළඹෙන දිනය දක්වා සේවය කළ යුතු ය.

ශ්‍රී ලංකාවේ අගනගරයෙහි පිහිටි එකම විශ්වවිද්‍යාලය වන කොළඹ විශ්වවිද්‍යාලය වනාහි එවකට පැවති ලංකා විශ්වවිද්‍යාල කොලීජිය හා ලංකා විශ්වවිද්‍යාලය සම්බන්ධ කරන ලදුව ස්ථාපිත ශීඝ්‍රයෙන් සංවර්ධනය වෙමින් පවතින පුරෝගාමී උසස් අධ්‍යාපන ආයතනයකි. කොළඹ විශ්වවිද්‍යාලය සිය නිත්‍ය හා විස්තෘත ශාස්ත්‍රීය වැඩසටහන් මගින් පර්යේෂණ හා මානව සම්පත් සංවර්ධනය උදෙසා ජාත්‍යන්තර සහයෝගීතා ප්‍රවර්ධන ව්‍යාපෘති රාශියක් සම්පාදනය කරන, අතිශය කීර්තිමත් ආයතනයක් ලෙස කලාපීය හා ජාත්‍යන්තර වශයෙන් බහුමානයට පාත්‍ර වූ විශ්වවිද්‍යාලයකි. ප්‍රථම උපාධි, පශ්චාත් උපාධි හා විස්තෘත අධ්‍යයන ධාරා ඔස්සේ දළ වශයෙන් 35,000 ක් පමණ වූ ශිෂ්‍ය ප්‍රජාවකට වෘත්තීය හා ප්‍රතිගෘහීත අධ්‍යයන පාඨමාලා ප්‍රදානය කරන කොළඹ විශ්වවිද්‍යාලයට මණ්ඩපයක්, පීඨ නවයක් (09), ආයතන අටක් (08) හා පාසලක් අයත් වේ. කොළඹ විශ්වවිද්‍යාලය උපකුලපතිවරයාගේ ඍජු අධීක්ෂණයට අයත් වන මධ්‍යස්ථාන කිහිපයක් හරහා ප්‍රජා සංවර්ධනය හා ජාතිය ගොඩනැගීම පරමාර්ථ කොටගත් විවිධ ව්‍යාපෘතීන්හි ද සක්‍රිය ව යෙදී සිටී.

උපකුලපති විශ්වවිද්‍යාලයේ පූර්ණ කාලීන නිලධරයකු විය යුතු අතර ප්‍රධාන විධායක නිලධරයා ද ප්‍රධාන අධ්‍යයන නිලධරයා ද විය යුතු ය. ඇය/ඔහු විශ්වවිද්‍යාලයීය පාලක සභාව හා සනාතන සභාව යන දෙකටම නිල බලයෙන් පත්වන සාමාජිකයකු වන අතර ඒවායෙහි සභාපති ධුරය ද දරයි. ඇය/ඔහු විශ්වවිද්‍යාලයේ ගිණුම්කරණ නිලධරයා වන අතර විශ්වවිද්‍යාලය තුළ විනය පවත්වාගෙන යාමේ වගකීම ද දරයි. විශ්වවිද්‍යාලයට අයත් කාර්ය කළමනාකරණය කිරීමේ දී පාරදෘශ්‍යතාව, වගවීම හා යහපාලනය පවත්වා ගැනීම පිළිබඳව උපකුලපති වගකිව යුතු ය. සුසංවිධිත කළමනාකරණ ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමෙන්, හඳුන්වාදීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් ශාස්ත්‍රීය ප්‍රජාවට නායකත්වය ලබාදීම උපකුලපතිගේ වගකීමකි.

උපකුලපති යනු සිය බුද්ධිමය හා කළමනාකරණ දක්ෂතාව මගින් විශ්වවිද්‍යාලයේ ආයතනික පරමාර්ථ අභිවර්ධනය කරලීමෙහි ලා යෝග්‍ය දර්ශනයක් ඇති පුද්ගලයෙකි. ඊට අමතර ව, උසස් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිවලට අදාළ ජාතික අවශ්‍යතා හඳුනාගැනීම උපකුලපතිගේ කාර්යයක් වන අතර පර්යේෂණය හා සංවර්ධනය ඇතුළු ශාස්ත්‍රීය ක්‍රියාකාරකම් මගින් විශ්වවිද්‍යාලයේ අභිවෘද්ධිය උදෙසා වන චිරකාල සාධනීය වටිනාකම් ශක්ති සම්පන්න කිරීමට ඇයට/ඔහුට හැකි විය යුතු ය. එබැවින් අයදුම්කරු/නාමිකයා උසස් ශාස්ත්‍රීය ශක්‍යතාවකින් හා ඍජු චර්යාවකින් ද සුවිශේෂ කාර්යසාධන වාර්තාවකින් ද යුක්ත එමෙන්ම, විශිෂ්ට සන්නිවේදන කුසලතා සහිත, ශිෂ්‍යයන්ගේ හා කාර්ය මණ්ඩලයේ බහුවිධ අභිලාෂ සාක්ෂාත් කිරීමෙහි ලා හැකියාව ඇති පුද්ගලයකු වීම අපේක්ෂා කරනු ලැබේ.

කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති වීමේ අභිලාෂ ඇති පුද්ගලයාට අස්ථාවර, අභියෝගාත්මක හා පීඩාකාරී අවස්ථා උපාය කෞශල්‍යය සහිතව කාර්යක්ෂමව හසුරුවා ගැනීමේ හැකියාව තිබිය යුතු ය. පැවරෙන කාර්ය මත පදනම්ව ඇයට/ඔහුට අවස්ථෝචිතව වැඩ කිරීමට හැකි විය යුතු ය. උපකුලපතිවරයාට ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකුගේ වැටුප සහ තනතුරට අදාළ දීමනා හිමිවන අතර ඊට අමතරව වැටුපෙන් 15% ක සංග්‍රහ දීමනාවක් ද හිමි වේ.

අයදුම්පත/නාමයෝජනාව පහත සඳහන් ලේඛනවලින් සමන්විත විය යුතු අතර පහත දක්වා ඇති පරිදි අංකනය කළ යුතුය.

අ. පහත සඳහන් මාතෘකා යටතේ ජීවදත්ත ලේඛනය.

අ.1 පෞද්ගලික විස්තර – නම, උපන් දිනය, ලිපිනය, සම්බන්ධතා අංක – දුරකථනය හා විද්‍යුත් තැපැල

අ.2 ශාස්ත්‍රීය හා වෘත්තීය සුදුසුකම්

අ.3 වර්තමාන තනතුර

අ.4 පසුගිය අවුරුදු පහළොව තුළ (15) දැරූ තනතුරු දින වකවානු සහිතව

අ.5 පරිපාලන පරිචය

අ.6 වෘත්තීය අනුබද්ධතා

අ.7 පර්යේෂණ පරිචය

- අ.7.1. අධීක්ෂණය කළ පර්යේෂක ශිෂ්‍ය සංඛ්‍යාව
- අ.7.ii හිමිව ඇති ප්‍රදාන සංඛ්‍යාව
- අ.7.iii ප්‍රකාශන
- අ.7.iv ජාත්‍යන්තර විද්‍යාත්මක/පර්යේෂණ සම්මන්ත්‍රණවලදී ඉදිරිපත් කළ සාරසංක්ෂේප
- අ.7.V ශ්‍රී ලංකාවේ විද්‍යාත්මක/පර්යේෂණ සම්මන්ත්‍රණවලදී ඉදිරිපත් කළ සාරසංක්ෂේප

අ.8 වෙනත් අදාළ තොරතුරු

අ.9 වචන 500 කට නොවැඩි අයදුම්කරු / නාමිකයා පිළිබඳ සංක්ෂිප්ත සටහන

ආ) විශ්වවිද්‍යාලයෙහි අභිවර්ධනය සඳහා වන ස්වකීය දර්ශනය මූලික ප්‍රකාශයක් හා ධුරයට පත්කරනු ලැබුවහොත් සාක්ෂාත් කරගැනීමට අපේක්ෂිත යෝජනා පිළිබඳ සංක්ෂිප්ත සටහනක්. තෝරා ගැනෙන අපේක්ෂකයන් ඒ පිළිබඳ මිනිත්තු 15 ක ඉදිරිපත් කිරීමක් සඳහා කැඳවනු ඇත.

ඇ) අයදුම්කරු/නාමිකයා වර්තමාන උපකුලපතිවරයා නම් හෝ මීට පෙර මෙම විශ්වවිද්‍යාලයේ උපකුලපති තනතුර හොබවා ඇත්නම්, ඉහත (ආ) ඡේදයේ දැක්වෙන ලේඛනවලට අමතරව ඔහුගේ / ඇයගේ පළමු ධුර කාලයට අදාළ කාර්යසාධන වාර්තාවක්.

ඇ) අයදුම්කරු/ නාමිකයා විශ්වවිද්‍යාල සේවයෙන් පරිබාහිරව සේවයෙහි නියුක්ත වන්නේ නම් අයදුම්කරු මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි බවට සේවායෝජකයාගෙන් ලිපියක්.

මෙම ලේඛනයෙහි පෙරටු පිටපතක් registrar@cmb.ac.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතු වේ. අදාළ ලේඛනය, වම් කෙළවරේ "උපකුලපති ධුරය" යනුවෙන් ලියන ලද මුද්‍රා තැබූ කවරයක බහා 2021 ඔක්තෝබර් 11 හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල් මගින් ලේඛකාධිකාරී, කොළඹ විශ්වවිද්‍යාලය – ශ්‍රී ලංකාව, 94, කුමාරතුංග මුනිදස මාවත, කොළඹ 03 යන ලිපිනයට එවිය යුතුය.

**ලේඛකාධිකාරී සහ පාලක සභා ලේකම්,**
**කොළඹ විශ්වවිද්‍යාලය,**
**ශ්‍රී ලංකාව.**

**ලේඛකාධිකාරී කාර්යාලය,**
**කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව,**
**94, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03.**